# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2320/04 - 2023 පෙබරවාරි මස 20 වැනි සඳුදා - 2023.02.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වන හා 5 වන වගන්ති යටතේ වූ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ (I) වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩය සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (II) තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මඟින් පනවමි.

**උපලේඛනය**

| *(I) වන තීරය* | | | | *(II) වන තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩයේ විස්තරය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතාංකය* | *විස්තරය* | |
| 1 | 04.07 | 0407.21 | අනෙකුත් අලුත් බිත්තර: ගල්ලුස් ඩොමැස්ටිකස් විශේෂයට ගැනෙන කුකුළන් | බිත්තරයකට රු. 50.00 |

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඉහත උපලේඛනයේ දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0407.21 යටතේ වර්ගීකරණය වන බිත්තර ආනයනය කිරීමේ දී අදාළ වන එක් බිත්තරයක් සඳහා වන රු. 50 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, බිත්තරයක් සඳහා රු. 1 ක් අයකර ගෙන ඉතිරි වටිනාකම, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් බිත්තර ආනයනය කිරීමේ දී, අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

3. මෙම නියමය, 2023 පෙබරවාරි මස 21 වැනි දින සිට ආරම්භ වන මාස තුනක (03) කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 02 - 0238

1A - PG 6233 — 431 (2023/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*